197743
17/08/2010

රු. 3000/-

# දේශීය ශාන්තිකර්මයන්හි පිළිබිඹු වන මනෝචිකිත්සක ලක්ෂණ පිළිබඳ ව කෙරෙන විමර්ශනයක්.

## (සපරගමුවේ ශාන්තිකර්ම ඇසුරින්)

විතාරමලාගේ ධනවර්ධන
ලි.ප.අං.GS/HU/1532

Libary - USJP
197743

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා
භාෂා හා සංස්කෘතික අධ්‍යයන විෂය යටතේ
ඉදිරිපත් කරන නිබන්ධනයයි.

197743

# දේශීය ශාන්තිකර්මයන්හි පිළිබිඹුවන මනෝචිකිත්සක ලක්ෂණ

## (සපරගමුවේ ශාන්තිකර්ම ඇසුරින්)

විතාරමලාගේ ධනවර්ධන

## නිබන්ධ සාරාංශය

මෙහි පළමු පරිච්ඡේදය යටතේ මෙම අධ්‍යයනයේ අරමුණු හා එහි විෂය ක්ෂේත්‍රය පිළිබඳ හැඳින්වීමක් කර ඇත. එහි දී ඓතිහාසික හා නූතන සාහිත්‍යමය මූලාශ්‍රගත සාධක පිරික්සා බලමින් මෙම චිකිත්සා ක්‍රමයන්හි ප්‍රභවය හා විකාශය සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කොට ඇත. ඒ සමග ම මෙම අධ්‍යයනයේදී අප විසින් අනුගත ක්‍රමවේදයන් ද එහිලා සවිස්තර ව දක්වා ඇත.

මෙහි දෙවන පරිච්ඡේදය වෙන්කොට ඇත්තේ සපරගමුවේ සමාජ, සංස්කෘතික පසුබිම හා එහි පවත්නා ශාන්තිකර්ම ආදිය හඳුනා ගැනීමක් කෙරෙහි ය. එහිදී අතීතයේ පැවැති හා වර්තමානයේ ප්‍රචලිත ව පවත්නා යක්තොවිල්, මඩුතෝත්‍ර හා බලියාග ආදී පිළිවෙත් ක්‍රමවල ආරම්භය විකාශය හා ඒවායෙහි වර්තමාන ස්වරූපය කෙබඳුදැයි යන්න හඳුන්වා දී ඇත. අනතුරු ව මෙම චිකිත්සා ක්‍රමවලදී ලෙඩරෝග හඳුනා ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන සිද්ධාන්ත හා මූලධර්ම ආදී කරුණු මෙහි තෙවන පරිච්ඡේදය යටතේ විග්‍රහයට ලක් කෙරේ. එහි දී ප්‍රථමයෙන් මෙම ප්‍රතිකාර ක්‍රමවලට ලක් කෙරෙන රෝගාබාධ අතුරින් සාම්ප්‍රදායික ව්‍යවහාරයේ පැවැත එන භූතරෝග හැටියට සැලකෙන රෝගාබාධත් නූතන ව්‍යවහාරයේ පවත්නා මානසික රෝග හැටියට සැලකෙන රෝගාබාධ සහ ඒවායෙහි ස්වභාවයත් විමසා බලන ලදී.

අනතුරු ව මෙබඳු රෝගාබාධ සුව කිරීම සම්බන්ධයෙන් නූතන මනෝවෛද්‍ය ක්ෂේත්‍රයෙහි භාවිත චිකිත්සා ක්‍රමයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් අපගේ සාම්ප්‍රදායික චිකිත්සා ක්‍රමයන් ඇගයීමට ලක් කර ඇත.

ඒ අනුව ප්‍රථමයෙන් යක්තොවිල්වල භූතරෝග නිවාරණය කරන විට ආවේශ කිරීම මාර්ගයෙන් රෝගියාට මනෝචිකිත්සනයට මඟ සලසන ආකාරය විමසා බැලීම්. එහි දී රෝගියා මනෝවශීකරණයට ලක්කොට චිත්තාරාධනයෙන් (Suggestion) රෝග සුව කරලීමට මග සලසන ආකාරය ද ඒ සඳහා මනෝවිශ්ලේෂණ (Psychoanalytic) හා මානසික ව පොළඹවා ගැනීම් හෙවත් අභිප්‍රේරණ Motivation වැනි ක්‍රමෝපායයන් ඇසුරු කරගන්නා ආකාරයත් සාකච්ඡාවට ලක් ව ඇත. මෙම චිකිත්සා ක්‍රමවල දී මෙරට සංස්කෘතිය පිළිගෙන ඇති ආකාරයට රෝගීනට තම රෝග කාරකයන් කවරහුදැයි යන්න ප්‍රකාශ කිරීමට ඉඩකඩ සළසා දෙන ආකාරයක් පෙනී ගියෙන් මනෝචිකිත්සාව විෂයෙහි එහි ඇති වටිනාකම් ද ඇගයීමට ලක් ව ඇත. ඒ සමග ම ආතුර මනස තුළ ධනාත්මක සිතුවිලි තහවුරු කිරීම (Afrimation) මාර්ගයෙන් ඔවුනට මානසික සුවය සළසා දීම සඳහා ගන්නා උත්සාහයන් ද මෙහි දී විමසා බැලේ.

අනතුරු ව යක්තොවිල්වලදී රෝගීනට බියට මුහුණ දීමට සැලැස්වීමෙන් (Exposure) යක්ෂයින් කෙරෙහි පවත්නා බිය පහකරලීම සඳහා ගනු ලබන උපාය මාර්ගයන් ඇගයීමට ලක් ව ඇත. එහිදී මෙබඳු බිය පහකරලීම් සම්බන්ධයෙන් නූතන මනෝ වෛද්‍ය ක්ෂේත්‍රයෙහි භාවිත චර්යා ප්‍රතිකාර ක්‍රමය (behaviour therapy) කෙරෙහි ද අපගේ අවධානය යොමු කෙරිණ.

ඒ සමග ම අධ්‍යාත්මික (spiritual) නොහොත් අධිමානසික චිකිත්සා (perapshycho theraphy) ක්‍රමයක් හැටියට පූර්වෝක්ත ප්‍රතිකාර ක්‍රමයන් ඇගයිය හැකි ද යන්න විමසා බැලිණ. එම කරුණ යටතේදී රෝග සුව කරන්නාත් සුවය ලබන්නාත් අතර ඔවුනොවුන් හදවතින් ම ඒකාත්මික භාවයකට යොමුවීම කෙරෙහි ගොඩනගා ගන්නා ලද පිළිවෙත් ක්‍රමයන් මෙහි දී සාකච්ඡාවට බඳුන් විය.

මේ හැර යක්කම් පෙළපාලි ආදියේ දී කෙරෙන අනුකරණාත්මක හා ප්‍රදර්ශන (modelling) ක්‍රියා ශාන්තිකර්ම මනෝචිකිත්සාව විෂයෙහි වැදගත් වන ආකාර ද විමසුමට ලක් ව ඇත. මෙම චිකිත්සා ක්‍රමවලදී රෝගීන් කායික හා මානසික වත්පිළිවෙත්වලට යොමු කරවීමෙන් රෝග සමනය කොට යථා තත්ත්වයට පත් කරවන (person is able to pain control through physical and mental rituals) ආකාරය එහිදී ඇගයීමට ලක් කෙරේ. එහි ලා නූතන මනෝ වෛද්‍ය ක්ෂේත්‍රයෙහි භාවිත මාර්ගෝපදේශණය හා උපදේශනය (guidance and counselling) වැනි ප්‍රතිකාර ක්‍රමයන්හි ලක්ෂණ පූර්වෝක්ත පිළිවෙත් ක්‍රමයන්හි ද පිළිබිඹු වන බවට තොරතුරු ඇතුළත් ය. මේ හැරුණු විට ශාන්තිකර්මයක ඇතුළත් සියළු අභිචාර ක්‍රම හා අඩුවැඩි වශයෙන් භාවිත වන නර්තන, ගායන, වාදන ආදියත් රංග උපකරණ, මෙවලම් හා සැරසිලි ආදියත් මනෝචිකිත්සාව විෂයෙහි වැදගත් වන ආකාරය සාකච්ඡාවට ලක් කෙරේ. මෙහි අවසාන පරිච්ඡේදය යටතේ ශාන්තිකර්ම හා බුදුසමය අතර ඇති සම්බන්ධතාව පිළිබඳ කරුණු විග්‍රහ කොට ඇත. එහිදී ත්‍රිවිධරත්නයේ බලය හා ශක්තිය මනෝචිකිත්සාව විෂයෙහි මූලික වශයෙන් පදනම් කොට ගෙන ඇති ආකාරය විමසා බැලේ.

# පටුන

පිටුව

උපකාරානුස්මෘති i

නිබන්ධන සාරංශය iii

ග්‍රන්ථනාම සංකේත නිරූපණ විධි v

පටුන viii

පළමු පරිච්ඡේදය

1.1 හැඳින්වීම 1-3

1.2 සාහිත්‍යයික විමර්ශන 4-16

1.3 ක්‍රමවිද්‍යාව 17-18

දෙවන පරිච්ඡේදය

2. සපරගමුවේ සමාජ සංස්කෘතික පසුබිම හා එහි පවත්නා ශාන්තිකර්ම 19-52

2.1 සපරගමුවේ සමාජ හා සංස්කෘතික පසුබිම

2.2 සපරගමුවේ ශාන්තිකර්ම

2.2.1 සපරගමුවේ මඩුයාග

2.2.2 සපරගමුවේ යක්තොවිල්

තුන්වන පරිච්ඡේදය

3. ශාන්තිකර්ම ආශ්‍රිත ව ලෙඩ රෝග හඳුනා ගැනීමේදී අනුගමනය කෙරෙන සිද්ධාන්ත හා මූලධර්ම 53-62

3.1 සාම්ප්‍රදායික වෙදකම යනු කුමක් ද?

3.2 ආයුර්වේදය

3.3 ලෙඩරෝග හඳුනා ගැනීමේ සාම්ප්‍රදායික ක්‍රමශිල්ප හා රෝග නිවාරණ විධි

3.4 ශාන්තිකර්ම ආශ්‍රිතව කෙරෙන රෝග පරීක්ෂා විධි

හතරවන පරිච්ඡේදය

4. ශාන්තිකර්මයන්හි පිළිබිඹු වන මනෝචිකිත්සක ලක්ෂණ 63-114

4.1 මානසික රෝග

4.2 භූතරෝග

4.3 රෝග නිවාරණ ක්‍රම

4.4 ශාන්තිකර්ම ප්‍රතිකාර ක්‍රම හා මනෝචිකිත්සණය

4.4.1 යක්තොවිල්වල ආවේශ කිරීම

4.4.2 ආවේශ මාර්ගයෙන් යටිහිත විමසා බැලීමෙන් පසු යක්ෂාවේශය හැරයන බවට සිත එකඟ කරවා ගැනීම

4.4.3 රෝගියා තුළ ධනාත්මකව සිතුවිලි තහවුරු කරලීම සඳහා ශාන්තිකර්මවල කෙරෙන මනෝචිකිත්සා ක්‍රම

4.4.4 බියට මුහුණ දීමට සැලැස්වීමෙන් යක්තොවිල්වල කෙරෙන මනෝචිකිත්සණය

4.4.5 ශාන්තිකර්ම ප්‍රතිකාර ක්‍රමය ආධ්‍යාත්මික නොහොත් අධි මානසික ප්‍රතිකාර ක්‍රමයක් බව

4.4.6 අනුකරණාත්මක හා ප්‍රදර්ශන ක්‍රියාමාර්ගයෙන් කෙරෙන මනෝ චිකිත්සණය

4.4.7 කායික හා මානසික චත්පිළිවෙත්වලට යොමු කරවීමෙන් රෝගීනට මනෝචිකිස්සණයට මග සැලසීම

4.4.8 ශාන්තිකර්මවලදී සමාජ සහයෝගය ලබා දීම මාර්ගයෙන් කෙරෙන මනෝචිකිත්සණය

පස්වන පරිච්ඡේදය

5. ශාන්තිකර්ම ආශ්‍රිත චිකිත්සා ක්‍රමය හා බුදුසමය අතර ඇති සම්බන්ධය 115-126

6. නිගමනය 127-130

7. ආශ්‍රිත ග්‍රන්ථාවලිය 131-138

8. උපග්‍රන්ථ 139-143